Department of Education,Sabaragamuwa Province/ Weekly School

# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව
## සති පාසල

විෂය - පෙරදිග සංගීතය

පෙබරවාරි මාසය

ශ්‍රේණිය - 9

2 - සතිය

නිපුණතාව 1.0 : සංගීතයේ මූලිකාංග, ශිල්පාංග හා සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 1.1: ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනියි.

ක්‍රියාකාරකම 1.1.1 : ***බිලාවල් රාගයට අයත් රාගාංග ඇතුළත් කෙටි ස්වර ඛණ්ඩ ගායනය***

ඉහත 1.1.1 ක්‍රියාකාරකමට අදාළ ව සපයා ඇති අංක 01, 02 හා, 03 පැවරුම් සම්පූර්ණ කරන්න.

පැවරුම 01

i. බිලාවල් රාගයට අයත් සර්ගමය හොඳින් නිරීක්ෂණය කරන්න. විශේෂයෙන් යටින් ඉරි ඇඳි ස්වර කොටස් පිළිබඳ ඔබේ අවධානය යොමු විය යුතු වන අතර ඒවා බිලාවල් රාගයට අයත් ප්‍රධාන රාග අංග වේ.

| 3 | x | 2 | 0 |
|---|---|---|---|
| ග ප ධ නි<br>ග - ම රි | ස්˚ - ධ ප<br>ග ප ධ නි | ම ග ම රි<br>ස්˚ නි ධ ප | ස රි ස -<br>ම ග රි ස |
| ප ප ධ නි<br>ග˚ රි˚ ස්˚ නි | ස්˚ - ස්˚ ස්˚<br>ප ධ නි ධ | ධ නි ස්˚ රි˚<br>ස්˚ නි ධ ප | ස්˚ නි ධ ප<br>ම ග රි ස |

ii. බිලාවල් රාගයට අයත් පහත දැක්වෙන ස්වර ඛණ්ඩ නිවැරදි ව අභ්‍යාස පොතේ සටහන් කර ගන්න.

සරිගම,ගරිගප/ සරිස,රිගමප/සරිගමප,මගමරිස/ගප,ධනිස/ධනිසරි,සනිධප/සරිස,ගමප,ගමරිස/ග මරි සරිස

පැවරුම 02

i. බිලාවල් රාගයට අයත් රාගාංග ඇතුළත් ස්වර ඛණ්ඩ භාවිත කරමින් සුදුසු තාලයකට අනුව ස්වර පේළි දෙකක් හෝ හතරක් නිර්මාණය කර ඊට ගැළපෙන ගී පාදයක් නිර්මාණය කරන්න.

පැවරුම 03

i. e තක්සලාව, e නැණපියස වෙබ් අඩවි හරහා හෝ අන්තර්ජාලයේ ඇතුළත් බිලාවල් රාගයට අයත් ශාස්ත්‍රීය ගායන වාදන පරිශීලනයට යොමුවන්න.

සැකසුම - W.N.ගයානි චන්ද්‍රකාන්ති - ර/නිවි/ඇලපාත මහා විද්‍යාලය